GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

08/9/2012

## මාධ්‍ය නිවේදනයයි.

**අදුරදර්ශී පරිපාලනය හේතුවෙන් කරවනැල්ල මූලික රෝහලේ රෝගී ජීවිත අවදානමේ.**

කරවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරීවරයා පසුගිය වසරක කාලයක් මුළුල්ලේ පෞද්ගලික හේතුවක් මත විදෙස්ගතව සිටි අතර එම කාලයේ වැඩ බලන වෛද්‍ය අධිකාරීතුමා විසින් රෝහලේ සියළුම කටයුතු ඉතා විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යනු ලැබිය. වෛද්‍ය අධිකාරීවරයා නැවත පැමිණීමත් සමඟ රෝහල තුල ඉතා අර්බුදකාරී තත්වයකට පත්විය.

ඔහු නැවත පැමිණීමත් සමඟ රෝහලේ සේවාවන් වල බොහෝ ගැටළු සහගත තත්වයකට පත්වී ඇති අතර රෝගී සත්කාරයට බලපාන ප්‍රායෝගික ගැටළු හදුනා නොගනිමින් එම ගැටළු පෙන්වා දුන්නද විධිමත් ක්‍රියා මාර්ග නොගනිමින් දැනුම් දීමකින් තොරව පුහුණු වෛද්‍ය නිලධාරීන් අත්තනෝමතික ලෙස වෙනත් ඒකක සඳහා අනුයුක්ත කරමින් විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදෙස් වලට පටහැනිව රෝගී සත්කාරයට බලපාන තීරණාත්මක තීන්දු ගනිමින් ඒ පිළිබඳ දැනුවත් කිරීමට ඉදිරිපත් වූ විට බැනවදිමින් කලහකාරී ලෙස හැසිරෙමින් වෛද්‍ය අධිකාරී වරයෙකුට නොගැලපෙන ලෙස ක්‍රියා කරමින් සිටියි.

මෙම අර්බුදකාරී තත්වය විසඳීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර මෙම තත්වය විසඳීමට වහාම ක්‍රියා මාර්ග ගන්නා ලෙස සෞඛ්‍ය බලධාරීන්ට බල කරමින් කරවනැල්ල රෝහලේ සියලුම වෛද්‍යවරු 2012-09-10 වන සඳුදා දින සංකේත වැඩ වර්ජනයක නිරත වීමට තීරණය කර ඇත.

ස්තූතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව
සහකාර ලේකම්.

**වැඩිදුර විස්තර**

**වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942**
**වෛද්‍ය නලින්ද හේරත් : 0717876516**
**වෛද්‍ය නවීන් සොයිසා : 0718582444**